# ජාතික ලුණු සමාගම

## කර්මාන්ත සහ ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යාංශය

**ජාතික ලුණු සමාගම කර්මාන්ත සහ ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යාංශයේ විෂය පථය යටතේ ක්‍රියාත්මක රජයට අයත් සමාගමකි. අපගේ කොළඹ ප්‍රධාන කාර්යාලයේ මන්නාරම ලේවායේ සහ අලිමංකඩ (කිලිනොච්චි) ලේවායේ පවත්නා පහත සඳහන් තනතුරු ඇබෑර්තු පිරවීම සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ.**

### නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී - (HM I-I) ස්ථිර පදනම මත (තනතුරු 01 - අලිමංකඩ ලුණු ලේවාය සඳහා)

**අවශ්‍ය සුදුසුකම්**

**බාහිර අයදුම්කරුවන් :**

1) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව (UGC) විසින් පිළිගත් විද්‍යා/ ඉංජිනේරු/ කළමනාකරණ/ වාණිජ්‍ය අංශයේ ප්‍රථම උපාධියක් **සමග**

ව්‍යාපාර පරිපාලන/ විද්‍යා/ ආර්ථික විද්‍යාව අංශයේ පශ්චාත් උපාධි (මාස්ටර්ස්) සුදුසුකම් හෝ තනතුරේ විෂය ක්ෂේත්‍රයට අදාළව පිළිගත් වරලත් වෘත්තීය ආයතනයක ආශ්‍රිත සාමාජිකත්වය,

**සහ**

"කළමනාකරණ තලයේ", සංස්ථාවක, ව්‍යවස්ථාපිත මණ්ඩලයක/ ආයතනයක හෝ පිළිගත් පෞද්ගලික / රාජ්‍ය නොවන ආයතනයක අවම වසර දෙළහක (12) ක පළපුරුද්ද. **හෝ**

2) තනතුරට අදාළ ක්ෂේත්‍රයක පිළිගත් වරලත් වෘත්තීය ආයතනයක පූර්ණ සාමාජිකත්වය.

**සහ**

"කළමනාකරණ තලයේ" සංස්ථාවක, ව්‍යවස්ථාපිත මණ්ඩලයක/ ආයතනයක හෝ ප්‍රසිද්ධ පෞද්ගලික / රාජ්‍ය නොවන සංවිධානයක අවම වසර දෙළහක (12) පළපුරුද්ද.

**අභ්‍යන්තර අයදුම්කරුවන් :**

1. ඉහත බාහිර අයදුම්කරුවන් වෙතින් අපේක්ෂිත සුදුසුකම් ලබා තිබීම,

**හෝ**

තනතුරට අදාළ විෂය ක්ෂේත්‍රයේ කළමනාකරු වර්ගීකරණයේ (MM) 1 ශ්‍රේණියේ තනතුරක අවම වසර පහක (05) සතුටුදායක සේවයක් සම්පූර්ණ කොට තිබීම.

**වැටුප් පරිමාණය :** HM1-1-2016 (මූලික වැටුප රු. 80,295-වැටුප් වර්ධක 15X2,270-114,345) සහ අනෙකුත්, රජයේ අනුමත දීමනා, ජීවන වියදම් දීමනාව රුපියල් 17,800 මාසික දීමනාව රුපියල් 5,000/= සමාගමෙන් සැපයෙන වාහනයක් හෝ වාහන දීමනාව - රු. 50,000/=, වෘත්තීය දීමනාව - රු. 3,000/=, දුරකථන දීමනාව රු. 3,750/= සහ රජයේ අනුමත ඉන්ධන දීමනාව ආදී දීමනා ලබාදෙනු ලැබේ.

**වයස :** අවුරුදු 35 ට නොඅඩු විය යුතු අතර, 55 ට නොවැඩි විය යුතුය. (මෙම ඉහළ වයස් සීමාව, රාජ්‍ය අංශයේ/ සංස්ථාවල හා අභ්‍යන්තර අයදුම්කරුවන්හට අදාළ නොවේ.)

**තෝරා ගැනීමේ ක්‍රමවේදය :** ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මගිනි.

### කළමනාකරු - අලෙවි (MM I-I) ස්ථිර පදනම මත (තනතුරු 01 - කොළඹ ප්‍රධාන කාර්යාලය සඳහා)

**අවශ්‍ය සුදුසුකම්**

**බාහිර අයදුම්කරුවන් :**

1) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව (UGC) විසින් පිළිගත් අලෙවි කළමනාකරණ හෝ වාණිජ්‍ය අංශයේ උපාධියක් සහ උපාධිය ලබාගත් පසු තනතුරට අදාළ ක්ෂේත්‍රයක ඕනෑම රජයේ හෝ පිළිගත් ආයතනයක අවම වසර එකක (01) පශ්චාත් සුදුසුකම් පළපුරුද්ද.

**හෝ**

2) CIM, SLIM විභාගවල අන්තර් මධ්‍ය තලය සමත්වීම සමග රජයේ ආයතනයක හෝ ඕනෑම පිළිගත් ආයතනයක අදාළ ක්ෂේත්‍රයේ අවම වසර එකක (01) පශ්චාත් සුදුසුකම් පළපුරුද්ද.

**අභ්‍යන්තර අයදුම්කරුවන් :**

1) ඉහත බාහිර අයදුම්කරුවන් වෙතින් අපේක්ෂිත සුදුසුකම් ලබා තිබීම,

**හෝ**

2) තනතුරට අදාළ විෂය ක්ෂේත්‍රයේ කනිෂ්ඨ කළමනාකරු (JM) වර්ගීකරණයේ තනතුරක අවම වසර පහක (05) සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කොට තිබීම.

**වැටුප් පරිමාණය :** MM1-1-2016 රු.(මූලික වැටුප 53,175/- වැටුප් වර්ධක -10X1,375-15X1,910-95,575) සහ ජීවන වියදම් දීමනාව රුපියල් 17,800 හා විශේෂ දීමනාව රුපියල් 5,000/= වෘත්තීය දීමනාව රු. 3,000/= දුරකථන දීමනාව රු. 2,000/= සහ රජයේ අනුමත අතිකුත් දීමනා ලබාදෙනු ලැබේ.

**වයස :** අවුරුදු 22 ට නොඅඩු විය යුතු අතර, 45 ට නොවැඩි විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන්හට මෙම ඉහළ වයස් සීමාව අදාළ නොවේ.

**තෝරා ගැනීමේ ක්‍රමවේදය**

ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මගිනි

### සහකාර කළමනාකරු - අලෙවි සහ විකුණුම් - (JM1-1) ස්ථිර පදනම මත (තනතුර 01 - අලිමංකඩ ලුණු ලේවාය සහ තනතුරු 01 - මන්නාරම ලුණු ලේවාය සඳහා)

**අවශ්‍ය සුදුසුකම් :**

**බාහිර අයදුම්කරුවන්**

1. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව (UGC) විසින් පිළිගත් අලෙවිකරණය/ ව්‍යාපාර පරිපාලනය/ වාණිජ්‍ය හෝ තනතුරේ විෂය ක්ෂේත්‍රයට අදාළ වෙනත් ඕනෑම උපාධියක්

අභ්‍යන්තර අයදුම්කරුවන් (පහත 1 හෝ 2)

1) ඉහත බාහිර අයදුම්කරුවන් වෙතින් අපේක්ෂිත සුදුසුකම් ලබා තිබීම.

**හෝ**

2) තනතුරට අදාළ විෂය ක්ෂේත්‍රයේ "සහකාර කළමනාකරු තාක්ෂණවේද නොවන" (MA1-I) II ශ්‍රේණියේ තනතුරක අවම වසර පහක (05) සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කොට තිබීම.

**වැටුප් පරිමාණය :** JM1-1-2016 රු.( මූලික වැටුප 42,600 - වැටුප් වර්ධක - 10X755-18X 1,135-70,580) සහ ජීවන අංක දීමනාව රු. 17,800/= විශේෂ දීමනාව රු. 5,000/= දුරකථන දීමනාව රු. 2,000/= සහ රජයේ අනුමත අතිකුත් දීමනා ලබාදෙනු ලැබේ.

**වයස :** අවුරුදු 22 ට නොඅඩු විය යුතු අතර, අවුරුදු 45 ට නොවැඩි විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන් හට මෙම ඉහළ වයස් සීමාව අදාළ නොවේ.

**තෝරා ගැනීමේ ක්‍රමවේදය**

ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මගිනි.

### සහකාර කළමනාකරු - ලුණු ලේවාය - (JM1-1) ස්ථිර පදනම මත (තනතුරු 01 - අලිමංකඩ ලුණු ලේවාය)

**අවශ්‍ය සුදුසුකම් :**

**බාහිර අයදුම්කරුවන්**

1) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව (UGC) විසින් පිළිගත් විද්‍යා/ කළමනාකරණ ක්ෂේත්‍රයේ උපාධියක්

**හෝ**

2) අදාළ ක්ෂේත්‍රයේ, ජාතික වෘත්තීය සුදුසුකම් 7 තලයට නොඅඩු ප්‍රවීණතා සහතිකයක් ලබාතිබීම.

**හෝ**

3) තත්ත්ව කළමනාකරණය ක්ෂේත්‍රයේ ජාතික වෘත්තීය සුදුසුකම් 6 තලයට නොඅඩු ප්‍රවීණතා සහතිකයක් ලබාතිබීම සහ අදාළ ක්ෂේත්‍රයේ වසර පහක (05) පළපුරුද්ද

**හෝ**

අ) තත්ත්ව කළමනාකණය සඳහා ජාතික වෘත්තීය සුදුසුකම් - 5 තලයට නොඅඩු ප්‍රවීණතා සහතිකයක් ලබාතිබීම සහ අදාළ ක්ෂේත්‍රයේ වසර දහයක) (10) පළපුරුද්ද.

**අභ්‍යන්තර අයදුම්කරුවන්**

1. ඉහත බාහිර අයදුම්කරුවන් වෙතින් අපේක්ෂිත සුදුසුකම් ලබාතිබීම.

**හෝ**

2. තනතුරට අදාළ විෂය ක්ෂේත්‍රයේ "කළමනාකරණ සහකාර තාක්ෂණවේද" (MA 2-1) II ශ්‍රේණියේ තනතුරක අවම වසර පහක (05) සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කොට තිබීම.

**වැටුප් පරිමාණය :** JM1-1-2016 : රු. (මූලික වැටුප 42,600 - වැටුප් වර්ධක 10X755-18X1,135-70,580) සහ ජීවන අංක දීමනාව රු. 17,800/= විශේෂ දීමනාව - රු. 5,000/= දුරකථන දීමනාව රු. 2,000/= සහ රජයේ අනුමත අතිකුත් දීමනා ලබාදෙනු ලැබේ.

**වයස :** අවුරුදු 22 ට නොඅඩු විය යුතු අතර අවුරුදු 45 ට නොවැඩි විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන්හට මෙම ඉහළ වයස් සීමාව අදාළ නොවේ.

**තෝරා ගැනීමේ ක්‍රමවේදය**

ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මගිනි.

### සහකාර කළමනාකරු - තත්ත්ව පාලන (JM 1-1) ස්ථිර පදනම මත (තනතුර 01 - මන්නාරම ලුණු ලේවාය)

**අවශ්‍ය සුදුසුකම්**

**බාහිර අයදුම්කරුවන්**

1) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව (UGC) විසින් පිළිගත් විද්‍යා/ කළමනාකරණ ක්ෂේත්‍රයේ **උපාධියක්**

**හෝ**

2) තත්ත්ව පාලන ක්ෂේත්‍රයේ ජාතික වෘත්තීය සුදුසුකම් 7 තලයට නොඅඩු ප්‍රවීණතා සහිකයක් ලබා තිබීම

**හෝ**

3) තත්ත්ව කළමනාකරණ ක්ෂේත්‍රයේ ජාතික වෘත්තීය සුදුසුකම් - 6 තලයට නොඅඩු ප්‍රවීණතා සහතිකයක් ලබාතිබීම සහ අදාළ කේෂ්ත්‍රයේ වසර පහක (05) පළපුරුද්ද

**හෝ**

4) තත්ත්ව කළමනාකරණ ක්ෂේත්‍රයේ ජාතික වෘත්තීය සුදුකම් - 5 තලයට නොඅඩු ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම සහ අදාළ ක්ෂේත්‍රයේ වසර දහයක (10) පළපුරුද්ද.

**අභ්‍යන්තර අයදුම්කරුවන්**

1. ඉහත බාහිර අයදුම්කරුවන් වෙතින් අපේක්ෂිත සුදුසුකම් ලබා තිබීම

**හෝ**

2. තනතුරට අදාළ විෂය ක්ෂේත්‍රයක "කළමනාකරණ සහකාර - තාක්ෂණවේද" (MA2-1) II ශ්‍රේණියේ තනතුරක අවම වසර පහක (05) සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කොට තිබීම.

වැටුප් පරිමාණය : JM1-1-2016 (රු. මූලික වැටුප 46,600- වැටුප් වර්ධක 10X755 - 18X1,135 - 70580) සහ ජීවන අංක දීමනාව රු. 17,800/= විශේෂ දීමනාව රු. 5,000/= දුරකථන දීමනාව රු. 2,000/= සහ රජයේ අනුමත අතිකුත් දීමනා ලබාදෙනු ලැබේ.

**වයස :** අවුරුදු 22 ට නොඅඩු විය යුතු අතර, අවුරුදු 45 ට නොවැඩි විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන්හට මෙම ඉහළ වයස් සීමාව අදාළ නොවේ.

**තෝරා ගැනීමේ ක්‍රමවේදය**

ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මගිනි.

### රසායනඥ - (JM1-1) ස්ථිර පදනම මත (තනතුරු 01 - අලිමංකඩ ලුණු ලේවාය)

**අවශ්‍ය සුදුසුකම් :**

බාහිර අයදුම්කරුවන් (පහත 1හෝ 2 හෝ 3 හෝ 4)

1. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව (UGC) විසින් පිළිගත් රසායන විද්‍යාව/ රසායනාගාර විද්‍යාව සහිත විද්‍යා උපාධියක් හෝ තනතුරෙහි විෂය ක්ෂේත්‍රයට අදාළ වෙනත් ඕනෑම උපාධියක්
2. තෘතියක සහ වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් තාක්ෂණ/ වෘත්තීය අභ්‍යාස ආයතනයකින් නිකුත් කළ රසායන විද්‍යාව/ රසායනාගාර ක්ෂේත්‍රයේ ජාතික වෘත්තීය සුදුසුකම් - 7 තලයට නොඅඩු ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම.
3. තෘතියක සහ වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් තාක්ෂණ/ වෘත්තීය අභ්‍යාස ආයතනයකින් නිකුත් කළ රසායන විද්‍යාව/ රසායනාගාර ක්ෂේත්‍රයේ ජාතික වෘත්තීය සුදුසුකම් - 6 තලයට නොඅඩු ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම.

**සහ**

සංස්ථාවක, මණ්ඩලයක හෝ පිළිගත් ව්‍යවස්ථාපිත ආයතනයක අදාළ ක්ෂේත්‍රයේ අවම වසර පහක (05) පශ්චාත් සුදුසුකම් පළපුරුද්ද.

4. තෘතියක සහ වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් තාක්ෂණ / වෘත්තීය අභ්‍යාස ආයතනයකින් නිකුත් කළ රසායන විද්‍යාව/ රසායනාගාර ක්ෂේත්‍රයේ ජාතික වෘත්තීය සුදුසුකම් - 5 තලයට නොඅඩු ප්‍රවීණතා සහතිකයක් ලබාතිබීම.

**සහ**

සංස්ථාවක, මණ්ඩලයක හෝ පිළිගත් ව්‍යවස්ථාපිත ආයතනයක අදාළ ක්ෂේත්‍රයේ අවම වසර දහයක (10) පශ්චාත් සුදුසුකම් පළපුරුද්ද

**අභ්‍යන්තර අයදුම්කරුවන්**

1. ඉහත බාහිර අයදුම්කරුවන් වෙතින් අපේක්ෂිත සුදුසුකම් ලබාතිබීම.

**වැටුප් පරිමාණය :** JM1-1-2016 රු (මූලික වැටුප 42,600 - වැටුප් වර්ධක - 10X755-18X1,135 - 70,580) සහ ජීවන අංක දීමනාව රු.17,800/= විශේෂ දීමනාව රු. 5,000/= දුරකථන දීමනාව රු. 2,000/= සහ රජයේ අනුමත අතිකුත් දීමනා ලබාදෙනු ලැබේ.

**වයස :** අවුරුදු 22 ට නොඅඩු විය යුතු අතර අවුරුදු 45 ට නොවැඩි විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන්හට මෙම ඉහළ වයස් සීමාව අදාළ නොවේ.

**තෝරා ගැනීමේ ක්‍රමවේදය**

ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණතයක් මගිනි.

### තොරතුරු තාක්ෂණ නිලධාරී - (MA2-1) ස්ථිර පදනම මත (තනතුරු 01 ප්‍රධාන කාර්යාලය)

**අවශ්‍ය සුදුසුකම්**

**බාහිර අයදුම්කරුවන්**

තෘතියක සහ වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් තාක්ෂණ/ වෘත්තීය අභ්‍යාස ආයතනයකින් නිකුත් කළ තොරතුරු තාක්ෂණ ක්ෂේත්‍රයේ ජාතික වෘත්තීය සුදුසුකම් - 5 තලයට නොඅඩු ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම.

**අභ්‍යන්තර අයදුම්කරුවන්**

ඉහත බාහිර අයදුම්කරුවන් වෙතින් අපේක්ෂිත සුදුසුකම් ලබා තිබීම.

**වැටුප් පරිමණය :** MA2-1-2016: රු. (මූලික වැටුප 30,310 - වැටුප් වර්ධක - 10X300-7X350-4X495-20X660-50,940) සහ ජීවන අංක දීමනාව රු. 17,800/= විශේෂ දීමනාව රු. 5,000/= සහ රජයේ අනුමත අතිකුත් දීමනා ලබාදෙනු ලැබේ.

**වයස :** අවුරුදු 18 ට නොඅඩු විය යුතු අතර අවුරුදු 45 ට නොවැඩි විය යුතුයි. අභ්‍යන්තර අයදුම්කරුවන්හට මෙම ඉහළ වයස් සීමාව අදාළ නොවේ.

**තෝරා ගැනීමේ ක්‍රමවේදය :**

ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මගිනි.

### කළමනාකරණ සහකාර (MA1-1) (මූල්‍ය අංශය සඳහා) ස්ථිර පදනම මත (තනතුරු - 02 අලිමංකඩ)

**බාහිර අයදුම්කරුවන්**

**අධ්‍යාපනික :**

අ) පහත සඳහන් විෂයන් ඇතුලුව විෂයන් හතරකට සම්මාන සාමාර්ථ සහිතව අ.පො.ස. (සා/ පෙළ) විභාගය එක් පෙති සිටීමකදී විෂයන් හයක් සමත් වී තිබීම.

i. සිංහල / දෙමළ
ii. ඉංග්‍රීසි භාෂාව (තනතුරට අවශ්‍ය වේ නම්)
iii. ගණිතය

ආ) අ.පො.ස. (උ/ පෙළ) විභාගය විෂයන් තුනක් (සාමාන්‍ය පොදු පරීක්ෂණය හැර) සමත් වී තිබීම (AAT සුදුසුකම සමග වාණිජ විෂය ධාරාවෙන් උසස් පෙළ විභාගයට පෙනී සිටීම අමතර වාසියක් වේ)

**සහ**

අදාළ ක්ෂේත්‍රයේ යතුරු ලියන/ පරිගණක දැනුම.

**අභ්‍යන්තර අයදුම්කරුවන්**

ප්‍රාථමික තලයේ - පුහුණු ප්‍රාථමික තලයේ - අර්ධ පුහුණු සහ ප්‍රාථමික තලයේ නුපුහුණු ප්‍රවර්ගයන්හි පහත සඳහන් සුදුසුකම් සහිත සේවකයන් අයදුම්කිරීම සඳහා සුදුසුකම් ලබති.

**අධ්‍යාපනික**

පහත සඳහන් විෂයන් ඇතුලුව විෂයන් හතරකට සම්මාන සාමාර්ථ සහිතව අ.පො.ස. (උ/ පෙළ) විභාගය විෂයයන් හයක් සමත් වී තිබීම.

i. සිංහල / දෙමළ
ii. ඉංග්‍රීසි භාෂාව (තනතුරට අවශ්‍ය වේ නම්)
iii. ගණිතය

**වෙනත්**

ඉහත සඳහන් සේවක ප්‍රවර්ගයක, ස්ථිර තනතුරක අවම වශයෙන් වසර පහක (05) සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කොට තිබීම.

**වැටුප**

**වැටුප් පරිමාණය :** MA1-1-2016: රු. (මූලික වැටුප 27,910 - වැටුප් වර්ධක - 10X300 - 7X350-4X495-20X660 - 48,540) සහ ජීවන අංක දීමනාව රු. 17,800/= විශේෂ දීමනාව රු. 5,000/- සහ රජයේ අනුමත අතිකුත් දීමනා ලබාදෙනු ලැබේ.

**වයස් සීමාව**

**වයස :** අවුරුදු 18 ට නොඅඩු විය යුතු අතර, අවුරුදු 45 ට නොවැඩි විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන්හට මෙම ඉහළ වයස් සීමාව අදාළ නොවේ.

**තෝරා ගැනීමේ ක්‍රමවේදය**

ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මගිනි.

### විකුණුම් නිලධාරි, කොන්ත්‍රාත් පදනම මත - එක් වසරක් සඳහා (තනතුර 01 - අලිමංකඩ ලුණු ලේවාය)

මෙම තනතුර සහකාර කළමනාකරුගේ (අලෙවි සහ විකුණුම්) අධීක්ෂණය යටතේ අලිමංකඩ ලුණු ලේවාය පදනම්ව පවතියි.

**අවශ්‍යතා**

- විෂයයන් හතරකට සම්මාන සහිතව අ.පො.ස (සා/ පෙළ) විභාගය විෂයන් හයක් සමත් වී තිබීම සහ අ.පො.ස. (උ/ පෙළ) විභාගය සමත් වී තිබීම.
- ව්‍යාපාර පරිපාලනය, අලෙවිකරණය හෝ අදාළ ක්ෂේත්‍රයක ඩිප්ලෝමා මට්ටමේ සුදුසුකමක් තිබීම වඩාත් සුදුසුවේ.
- නවීන වෙළඳ පොළ (Modern Trade) පිළිබඳ පළපුරුද්ද වාසි සහගත වේ.
- ඉහළ සන්නිවේදන, සාකච්ඡා සහ අන්තර් පුද්ගල කුසලතා
- ස්වාධීනව වැඩ කිරීමේ හැකියාව සහ වේගවත්ව වෙනස් වන පරිසරයක කණ්ඩායමක කොටසක් ලෙස වැඩ කිරීමේ හැකියාව.

**වැටුප**

**මූලික වැටුප** - (රු. 30,310/=) සහ රජයේ අනුමත අතිකුත් දීමනා (ජීවන අංක දීමනාව රු. 17,800/= විශේෂ දීමනාව රු. 5,000/=)

**වයස් සීමාව** : වයස අවුරුදු 18 ට නොඅඩු විය යුතු අතර අවුරුදු 45 ට නොවැඩි විය යුතුය.

**තෝරා ගැනීමේ ක්‍රමවේදය**

ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මගිනි.

### යාන්ත්‍ර ක්‍රියාකරු - කොන්ත්‍රාත් පදනම මත - එක් වසරක් සඳහා (තනතුරු 01 - අලිමංකඩ ලුණු ලේවාය)

**රැකියා සාරාංශය**

නිදහස් ප්‍රවාහ ලුණු කුඩු කිරීමේ යන්ත්‍ර ක්‍රියාකරුවෙකු ලෙස, කාර්යක්ෂම නිෂ්පාදනයක් සහ ඉහළ ගුණාත්මක නිෂ්පාදනයක් සහතික කිරීම සඳහා කම්හල් යන්ත්‍රෝපකරණ සහ උපකරණ ක්‍රියාත්මක කිරීම සහ නඩත්තු කිරීම සඳහා ඔහු/ ඇය වගකිව යුතුය.

**අවශ්‍ය සුදුසුකම්**

තෘතියික සහ වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් තාක්ෂණ/ වෘත්තීය අභ්‍යාස ආයතනයකින් නිකුත් කළ යාන්ත්‍රික/ මෝටර් රථ/ අදාළ ක්ෂේත්‍රයක ජාතික වෘත්තීය සුදුසුකම් 5 තලයට නොඅඩු ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම සමග රජයේ කර්මාන්ත ආශ්‍රිත ආයතනයක හෝ පිළිගත් පෞද්ගලික / ආයතනික ක්ෂේත්‍රයේ අවම වසර දෙකක පළපුරුද්ද.

**වැටුප:**

මූලික වැටුප (රු. 30,310/=) සහ රජයේ අනුමත වෙනත් දීමනා.

(ජීවන අංක දීමනාව රු. 17,800/= විශේෂ දීමනාව රු. 5,000/=)

**වයස් සීමාව**

වයස අවුරුදු 18 ට නොඅඩු විය යුතු අතර, අවුරුදු 45 ට නොවැඩි විය යුතුය.

**තෝරා ගැනීමේ ක්‍රමවේදය**

ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මගිනි.

### ජ්‍යෙෂ්ඨ කාර්මික - කොන්ත්‍රාත් පදනම මත එක් වසරක් සඳහා (තනතුරු 01 - අලිමංකඩ ලුණු ලේවාය)

**රැකියා සාරාංශය**

ජ්‍යෙෂ්ඨ කාර්මික යනු අපගේ නිෂ්පාදන යන්ත්‍රෝපකරණ සහ උපකරණ අධීක්ෂණය කිරීම සඳහා යාන්ත්‍රික අලුත්වැඩියාව සහ නඩත්තුව පිළිබඳ විශේෂඥ දැනුම ඇත්තෙකි. නිෂ්පාදන ඉලක්ක සපුරා ගැනීම සඳහා නිෂ්පාදන යන්ත්‍රෝපකරණ සහ උපකරණ ආරක්ෂිතව සහ කාර්යක්ෂමව ක්‍රියාත්මක වන බව සහාථ කිරීම ජ්‍යෙෂ්ඨ කාර්මික විසින් කාර්මික ශිල්පියෙකුගේ රාජකාරි ඉටුකරනු ඇත.

**අවශ්‍ය සුදුසුකම්**

තෘතියික සහ වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් තාක්ෂණ/ වෘත්තීය අභ්‍යාස ආයතනයකින් නිකුත් කළ යාන්ත්‍රික/ මෝටර් රථ/ අදාළ ක්ෂේත්‍රයක ජාතික වෘත්තීය සුදුසුකතම් - 5 තලයට නොඅඩු අදාළ විෂයක ප්‍රවීණතා සහතිකයක් ලබාතිබීම. සමග රජයේ කර්මාන්ත ආශ්‍රිත ආයතනයක හෝ පිළිගත් පෞද්ගලික / ආයතනික ක්ෂේත්‍රයේ අවම වසර දෙකක පළපුරුද්ද.

**වැටුප**

මූලික වැටුප (රු. 30.310/=) සහ රජයේ අනුමත අතිකුත් දීමනා (ජීවන අංක දීමනාව රු. 17,800/=) විශේෂ දීමනාව රු 5,000/=

**වයස් සීමාව :**

වයස අවුරුදු 18 ට නොඅඩු වියයුතු අතර අවුරුදු 45 ට නොවැඩි විය යුතුය.

**තෝරා ගැනීමේ ක්‍රමවේදය**

ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මගිනි.

### පැස්සුම්කරු - කොන්ත්‍රාත් පදනම මත - එක් වසරක් සඳහා (තනතුරු 01 - අලිමංකඩ ලුණු ලේවාය)

**අවශ්‍ය සුදුසුකම්**

තෘතියක සහ වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් තාක්ෂණ/ වෘත්තීය අභ්‍යාස ආයතනයකින් නිකුත් කළ යාන්ත්‍රික/ මෝටර් රථ/ අදාළ ක්ෂේත්‍රයක ජාතික වෘත්තීය සුදුසුකම් හතර (04) තලයට නොඅඩු, තනතුරෙහි කාර්යයන්ට අදාළ ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම.

**වැටුප**

**මූලික වැටුප :** (රු. 26,290/=) සහ රජයේ අනුමත අතිකුත් දීමනා (ජීවන අංක දීමනාව රු. 17,800/= මාසික දීමනාව රු. 5,000/=)

**වයස් සීමාව**

වයස අවුරුදු 18 ට නොඅඩු විය යුතු අතර අවුරුදු 45 ට නොවැඩි විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන්හට මෙම ඉහළ වයස් සීමාව අදාළ නොවේ.

**තෝරා ගැනීමේ ක්‍රමවේදය**

ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මගිනි

### සහකාර යන්ත්‍ර ක්‍රියාකරු - කොන්ත්‍රාත් පදනම මත - එක් වසරක් සඳහා (තනතුරු 01 - අලිමංකඩ ලුණු ලේවය සහ තනතුරු 01 - මන්නාරම ලුණු ලේවාය)

**රැකියා සාරාංශය**

නිෂ්පාදන ඉලක්ක සපුරා ගැනීම සහතික කරගැනීම සඳහා කම්හල් යන්ත්‍රෝපකරණ අධීක්ෂණයට සහ නඩත්තුවට යන්ත්‍ර ක්‍රියාකරුට සහයවීම මගින් නිදහස් ප්‍රවාහ ලුණු කුඩු කිරීමේ කම්හලට සහය දැක්වීමේ වගකීම සහකාර යන්ත්‍ර ක්‍රියාකරු සතුවේ.

**අවශ්‍ය සුදුසුකම්**

තෘතියක සහ වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් තාක්ෂණ/ වෘත්තීය අභ්‍යාස ආයතනයකින් නිකුත් කළ යාන්ත්‍රික/ මෝටර් රථ/අදාළ ක්ෂේත්‍රයක ජාතික වෘත්තීය සුදුසුකම් හතර (04) තලයට නොඅඩු තනතුරෙහි කාර්යයට අදාළ ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම.

**වැටුප :**

**මූලික වැටුප :** (රු. 26,290/=) සහ රජයේ අනුමත අතිකුත් දීමනා (ජීවන අංක දීමනාව රු. 17,800/= **මාසික දීමනාව :** රු. 5.000/=)

**වයස් සීමාව :**

වයස අවුරුදු 18 ට නොඅඩු විය යුතු අතර, අවුරුදු 45 ට නොවැඩි විය යුතුය.

**තෝරා ගැනීමේ ක්‍රමවේදය**

ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මගිනි.

### රියදුරු - කොන්ත්‍රාත් පදනම මත - එක් වසරක් සඳහා (තනතුරු 01 - අලිමංකඩ ලුණු ලේවාය)

**අවශ්‍ය සුදුසුකම්**

**අධ්‍යාපනික**

01. පෙනී සිටීම් දෙකකදී අවම වශයෙන් සම්මාන සාමාර්ථ දෙකක් (02) සහිතව අ.පො.ස (සා/ පෙළ) විභාගය විෂයන් හයකින් (06) සමත් වී තිබීම සහ මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ, කොමසාරිස් ජනරාල් විසින් නිකුත් කරන ලද බර වාහන රියදුරු බලපත්‍රයක් (අපේක්ෂිත ප්‍රවීණතාවය පැහැදිලිව සඳහන් කළ යුතුය.) සතුවිය යුතු අතර, රියදුරු බලපත්‍රය ලබාගැනීමෙන් පසු අවම වසර තුනක (03) පළපුරුද්ද තිබිය යුතුය.

**වැටුප**

**මූලික වැටුප :** (රු. 26,290/=) සහ රජයේ අනුමත අතිකුත් දීමනා (ජීවන අංක දීමනාව රු. 17,800/= මාසික දීමනාව : රු. 5.000/=)

**වයස් සීමාව :**

වයස අවුරුදු 18 ට නොඅඩු විය යුතු අතර, අවුරුදු 45 ට නොවැඩි විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන්හට මෙම ඉහළ වයස් සීමාව අදාළ නොවේ.

**තෝරා ගැනීම් ක්‍රමවේදය**

ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මගින් සහ ප්‍රායෝගික පරීක්ෂණයක් මගින්

**වෙනත් :**

1. සේවකයාගේ කාර්ය සාධනය සහ සමාගමේ අවශ්‍යතාවය මත පදනම්ව සියලුම කොන්ත්‍රාත් තනතුර දීර්ඝ කිරීමට යටත් වේ.
2. සෑම අයදුම්කරුවෙක්ම
   i. ශ්‍රී ලාංකික පුරවැසියෙක් විය යුතුය.
   ii. තනතුරට අදාළ රාජකාරි මනා ලෙස ඉටු කිරීමටත්, දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවයය කිරීමටත් හැකි වන සේ මනා මානසික හා ශාරීරික සුවතාවයකින් යුක්ත විය යුතුය.
   iii. විශිට චරිතයකින් යුක්ත විය යුතුය.

කරුණාකර ඔබගේ ජීවදත්ත සහිත අයදුම්පත්, අදාළ සහතිකවල පිටපත් සමග ලියාපදිංචි තැපෑලෙන් පහත සඳහන් ලිපිනය වෙත 2025.03.17 දින හෝ ඊට පෙර ලැබෙන සේ එවිය යුතුය.

**සාමාන්‍යාධිකාරී, ජාතික ලුණු සමාගම,**
**අංක 561/3, ඇල්විටිගල මාවත,**
**කොළඹ 05.**
**0112368974**

අයදුම්පත් බහා එවන ලිපි කවරයෙහි ඉහළ වම් කෙළවරෙහි අයදුම් කරනු ලබන තනතුරු ශීර්ෂය සඳහන් කළ යුතුය.

කෙටි ලැයිස්තුගත අයදුම්කරුවන් පමණක් සම්මුඛ පරීක්ෂණ සඳහා කැඳවනු ලැබේ.